සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: නාට්‍ය හා රංගකලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි.

**(i)** සියළු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**(ii)** අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

**(iii)** ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

**(iv)** එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

---

- පහත දැක්වෙන පාඨ ආශ්‍රයෙන් අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(A) පුතා නැතුව කුමට ද රජ සැපත දෙවියනේ අද
සිතාගෙනම ආවේ රජු මරණ විලසි නේ
පතා ගෙනම පූරුවේ පෙර කරුමයකි අනේ මගේ
පුතා ඉතින් නොදැක යාය ප්‍රාණෙ විගසිනේ

(B) යක් දෙස්සා : අනේ බොලන්, මම උදැල්ලේම මාස ගණනක් ඇවිදිනවා
බෙරකරු : උදැල්ල නෙවේ බං. නිදැල්ලෙ

(C) නැත පියාණනි කිසිදු මන දොළ
සමා වුව මැන දොසක් වී නම්

(D) පිරිස - උපතින් ලැබූ මොලයක් ඇත.
මාපියන්ට පිං ලැබෙන්න අත පය හයියට ඇත අපට.

(01) ජයලත් මනෝරත්නයන්ගේ ලෝක ධර්මී නාට්‍යයක් හා සම්බන්ධ වන්නේ,

(1) A (2) B (3) C (4) D

(02) 80 දශකයේ නිර්මාණය වූ නාට්‍යයක් හා සම්බන්ධ වන්නේ,

(1) A (2) B (3) C (4) D

(03) උඩරට ශාන්ති කර්මයක් හා සම්බන්ධ වන්නේ,

(1) A (2) B (3) C (4) D

(04) සරත්චන්ද්‍ර ශූරීන්ගේ නාට්‍යයක් හා සම්බන්ධව ඇත්තේ,

(1) A (2) B (3) C (4) D

(05) නර්තන කලාව ඉදිරිපත් කිරීමේ දී ප්‍රධාන වන අභිනය,

(1) ආහාර්ය අභිනය (2) ආංගික අභිනය (3) සාත්වික අභිනය (4) සතර අභිනය

(06) නළු - ප්‍රේක්ෂක සහසම්බන්ධය ඉතා වැදගත් වන්නේ,

(1) වේදිකා නාට්‍යයක දී. (2) ඔපෙරාවක දී.

(3) නර්තනයක දී. (4) මුද්‍රා නාටකයකදී

(07) නාට්‍යයකදී ප්‍රේක්ෂක රසවින්දනයට ආසන්නම සාධකය වන්නේ,

(1) රංග වින්‍යාසයයි (2) නළු කාර්යයි

(3) රංගාලෝකයයි (4) ප්‍රේක්ෂාවයි

(08) වේදිකාවම ආලෝකවත් කිරීම සඳහා යොදා ගන්නා ආලෝක පහන වන්නේ,

(1) යොමු පහන (2) ධාරාලෝක පහන

(3) වර්ණ චක්‍රය (4) ආලෝක බුබුළු පෙළ

(09) වේෂ භූෂණ සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශනය වන්නේ,

(1) වේෂ භූෂණ යනු රංග වස්ත්‍රාභරණ යි.

(2) වේෂ භූෂණ අභ්‍යන්තර සමාරෝපය සඳහා අත්‍යවශ්‍ය වේ

(3) වේෂ භූෂණ යනු ඇඳුම් සහ පැළඳුම් ය.

(4) වේෂ භූෂණ ප්‍රේක්ෂාවට දායක නොවේ.

(10) අංග රචනය සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,

(1) අංග රචනයේ ප්‍රධාන ප්‍රභේද සතරකි.

(2) නිර්මිත චරිත, නිර්මාණශීලී චරිත අයත් වන්නේ චරිතාංග අංග රචනයටයි.

(3) සරල අංග රචනය යනු ඍජු අංග රචනය නොවේ.

(4) අංග රචනය රංග රචනය යනුවෙන් ද හඳුන්වයි.

(11) නාට්‍යධර්මී නාට්‍යයක ලක්ෂණයක් සේ සැලකෙන්නේ,

(1) රඟපෑම අස්වාභාවික ලෙස ඉදිරිපත් කිරීමයි.

(2) සැබෑ ලෝකයට සමාන අයුරින් අභිනය පෑමයි.

(3) කලින් සම්මත කර ගත් රංග සම්මුතීන්ට අනුව අභිනය පෑමයි.

(4) සිදුවීම ශෛලීගත ආකාරයට ඉදිරිපත් කිරීමයි.

(12) ආංගික අභිනය හා සාත්වික අභිනය මූලික කර ගත් ප්‍රාසංගික කලාව වන්නේ,

(1) ඔපෙරා (2) ග්‍රීක නාටක

(3) බැලේ (4) අභිරූපණ

(13) නාට්‍ය අධ්‍යක්ෂණයේ දී අධ්‍යක්ෂවරයා

(1) ආධුනික නළු නිළියන්ට පමණක් උපදෙස් ලබා දිය යුතුයි.

(2) ප්‍රවීණ නළුවන්ගෙන් උපදෙස් ලබා ගත යුතුයි.

(3) නාට්‍ය පෙළෙහි ඇති අර්ථ කථනය මතු කර ගත යුතුයි.

(4) සොඳුරු ආඥාදායකු විය යුතුයි.

(14) වේදිකා නාට්‍යයේ රංග වින්‍යාසය සම්බන්ධයෙන් ප්‍රකට නාමයක් වන්නේ,

(1) චන්න විජේවර්ධන (2) ජෙරෝම් ද සිල්වා

(3) ප්‍රසන්නජිත් අබේසූරිය (4) විද්‍යාරත්න ප්‍රනාන්දු

(15) අංග රචනා ද්‍රව්‍යයක් ලෙස නම් කළ හැක්කේ,

(1) ස්පෝන්ජ් (2) කතුර (3) කණ්ණාඩිය (4) ක්‍රේප් හෙයර්

(16) රංග අභ්‍යාස කිරීමෙන්,

(1) සබකෝලය නැති වේ.

(2) සහසම්බන්ධතාවය වැඩි කරයි.

(3) කය සහ මනස සමබර කරයි.

(4) අධ්‍යක්ෂවරයාගේ අර්ථකතනය අවබෝධ කර ගනී.

(17) නූර්ති සඳහා සංගීතය සැපයූ සංගීතඥයෙක් වනුයේ,

(1) බලිවාලා (2) අලා උද්දීන් බල්ජි

(3) විශ්වනාත් ලව්ජි (4) සී දොන් බස්තියන්

● පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් 18 සිට 22 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

| නාට්‍යයේ නම | රචකයාගේ නම | පරිවර්තනය අනුවර්තනය | මෙරට නිෂ්පාදන පරිවර්තනය |
|---|---|---|---|
| රූඩන්ස් | A | කඹය | බන්දුල ජයවර්ධන |
| ද ෆාදර් | ඕගස්ට් ස්ට්‍රින් බර්ග් | පීතෘ | B |
| රත්නාවලී නාටිකා | ශ්‍රී හර්ෂ | රත්නාවලී | C |
| ලේඩි ෆ්‍රොම් ද සී | D | සයුරෙන් ආ ලඳ | සුනන්ද මහේන්ද්‍ර |
| ඇපල් කාර්ට් | E | ඇපල් කරත්තය | පියදාස නිශ්ශංක |

f

(18) ඉහත වගුවේ A කොටුවට ඇතුලත් විය යුතු රචකයාගේ නම වන්නේ,

(1) සෙනෙකා (2) ප්ලෝටස්

(3) මිනැන්ඩර් (4) සොෆොක්ලිස්

(19) ඉහත වගුවේ B කොටුවට අයත් නාමය වන්නේ,

(1) සුනන්ද මහේන්ද්‍ර (2) පියදාස නිශ්ශංක

(3) මැන්දිස් රෝහනධීර (4) ප්‍රේමරංජිත් තිලකරත්න

(20) ඉහත වගුවේ C කොටුවට නියමිත නාමය වන්නේ,

(1) සිරිල් සී පෙරේරා (2) එස්.කරුණාරත්න

(3) සුනිල් විජේසිරිවර්ධන (4) පියදාස නිශ්ශංක

(21) ඉහත වගුවේ D කොටුවට නියමිත නාමය වන්නේ,

(1) මැක්සිම් ගෝර්කි (2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්

(3) හෙන්රික් ඉබ්සන් (4) ටෙනිසි විලියම්ස්

(22) ඉහත වගුවේ E කොටුවට නියමිත නාමය වන්නේ,

(1) ඇන්ටන් චෙකෝව් (2) යෙව්ගිනි ෂ්වාට්ස්

(3) බර්නාඩ් ෂෝ (4) සැමුවෙල් බෙකට්

(23) වේදිකාවේ කලබලකාරී ස්වභාවයක් ඇතිකර ලීමට උපයෝගී කර ගත හැකි පහන කුමක් ද?

(1) අල්ට්‍රා වයලට් (2) ස්ට්‍රොබ්

(3) යොමු පහන (4) මිරර් බෝල්

(24) වේෂභූෂණ සකස් කළ යුත්තේ,

(1) පහසුවෙන් සොයා ගත හැකි ද්‍රව්‍ය වලිනි.

(2) දීප්තිමත් වර්ණ යොදා ගෙන ආකර්ෂණීය වන ලෙසිනි.

(3) රූපණ ශිල්පීන්ගේ උවමනාව මතය.

(4) නාට්‍ය පෙළ මඟින් ඉල්ලා සිටිනු ලබන ආකාරයටය.

- **පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් 25 සිට 29 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**



A




B



C



D



E

(25) වේදිකා නාට්‍ය මෙන්ම රූපවාහිනී නාට්‍ය සඳහා ද එකසේ ප්‍රකට නාමය අයත් ඡායාරූපය

(1) A (2) B (3) C (4) D

(26) කැළණි පාලම සම්බන්ධ රූපණ ශිල්පියා,

(1) A (2) E (3) B (4) D

(27) 60 දශකයේ පුරෝගාමී නාට්‍යකරුවෙක් වන්නේ,

(1) A (2) B (3) C (4) D

(28) 70 දශකයේ නාඩගම් සම්ප්‍රදායේ නාට්‍යයක් කළ නාට්‍යකරුවාගේ ඡායාරූපය,

(1) A (2) D (3) B (4) E

(29) කපුටු බෝ, දුවිලි, රජ කතාව වැනි නාට්‍ය රචනා කළ නාට්‍යකරුවාගේ ඡායාරූපය

(1) B (2) C (3) E (4) A

(30) අභිරූපණ මෙන් ම සිනමා නළුවෙකු ලෙස ද නම් දරා සිටි ශිල්පියා වන්නේ,

(1) විමල් කුමාර් ද කොස්තා (2) අමරසිරි කලංසූරිය

(3) තිස්ස විජේසුරේන්ද්‍ර (4) විජය නන්දසිරි

(31) නාඩගම් නාට්‍යයක රංගනය ආරම්භ වන්නේ,

(1) සෙල්ලම් ළමා කරලියෙන් පිටව යාමත් සමගය

(2) අතීත වක්තෘ පැමිණීමෙන් පසුය.

(3) හඬ දූතයින් පැමිණීමට පෙරය.

(4) රජු සහ බිසවගේ සම්ප්‍රාප්තියත් සමඟය.

(32) නාට්‍ය සංවිධායකවරයාගේ කාර්යයක් වන්නේ,


(1) නාට්‍යයේ රංග වින්‍යාසය පිළිබඳව අවධානයෙන් සිටීමයි.

(2) අධ්‍යක්ෂවරයා සමඟ නාට්‍ය නිර්මාණය කිරීමයි.

(3) රඟහල වෙන් කිරීම හා ප්‍රවේශපත් අලෙවි කිරීම.

(4) නියමිත වේලාවට නාට්‍ය දර්ශනය ආරම්භ කිරීමයි.

- **පහත වෙස් මුහුණු දෙක ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**



(A)



(B)

(33) A හා B යන මුහුණු අනුපිළිවෙලින්,

(1) සන්නි මුහුණු දෙකකි (2) කෝලම් මුහුණු දෙකකි.

(3) කෝලම් මුහුණක් හා සන්නි මුහුණකි. (4) සන්නි මුහුණක් හා කෝලම් මුහුණකි.

(34) ඉහත එක් වෙස් මුහුණකින් නියොජනය කරන චරිතය කරනා රාජකාරිය වන්නේ,

(1) අණබෙර ගැසීමයි (2) ආරක්ෂක කටයුතු

(3) රෙදි සේදීම (4) වළං සේදීම

(35) මෙම වෙස්මුහුණු සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) අම්බලන්ගොඩ හා උඩුනුවර මෙම නාටකය ප්‍රසිද්ධය.

(2) ගැමි නාටකයට වඩා දියුණු නාට්‍ය විශේෂයකි.

(3) නූර්ති වලට පසුව කියවෙන රැඟුම් විශේෂයකි.

(4) මහාචාර්යය M.H ගුණතිලක මහතා මේ නාටක පිළිබඳව පර්යේෂණ කර ඇත.

(36) ගාමිණී හත්තෙට්ටුවේගම මහතාගේ වීදි නාට්‍යයක් වන්නේ,

(1) ලෝක ආහාර සම්මේලනය (2) මෝදර මෝල

(3) බිහිවණු බෝසතාණෙනි (4) පෙරළෙන ඉරණම

(37) "තුන්වැනි සීනුව" නමින් නාට්‍ය උළෙලක් තමා විසින් ම සංවිධානය කර ගත්තේ,

(1) ජැක්සන් ඇන්තනී (2) ශ්‍රියන්ත මෙන්ඩිස්

(3) රත්නා ලාලනී (4) ජයලත් මනෝරත්න

(38) "මොනවද බං විභාගෙ විභාගේ, විභාගේ වෙන දෙයක් ගැන කතා කරපල්ලකෝ" විකෘති නාට්‍යයේ ඉහත සංවාදය කියන ලද්දේ,

(1) සම්පත් (2) ප්‍රියංගනී

(3) මිතුරියක් (4) රංජිත්

(39) විකෘති නාට්‍ය පිටපතට "සෝමලතා සුබසිංහ", යොවුන් නාට්‍ය හා "විකෘති" යන මැයෙන් ලිපියක් ලියා ඇත්තේ,

(1) නාට්‍යවේ දී රාජිත දිසානායක

(2) නාට්‍යවේ දී පියල් කාරියවසම්

(3) නාට්‍යවේ දී චාමික හත්ලහවත්ත

(4) නාට්‍යවේ දී ප්‍රසන්නජිත් අබේසූරිය

(40) "දෙයක් වේනම් යම් සුදුස්සාටම අයිති විය යුතු" යන තේමාව ප්‍රකට කරන වේදිකා නාට්‍යය,

(1) දික්තල කාලගෝල (2) හුණුවටයේ කතාව

(3) නරිබැණා (4) කුවේණි